# ප්‍රධාන තොරතුරු ඇතුලත් ලේඛනය - අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි සහ වැඩිදුර තොරතුරු

## ප්‍රධාන තොරතුරු ලේඛනය - ණය කාඩ්පත්

| නිර්ණායක | විස්තරය |
|---|---|
| **ප්‍රධාන ලක්ෂණ සහ ස්වභාවය** | • Standard, Gold, Titanium, Platinum සහ World වශයෙන් MasterCard කාඩ්පතක් ලබා ගත හැක.<br>• දෙමුහුණත් කාඩ්පත් (ආරක්ෂිත කාවැද්දූ චිපය මගින් සම්බන්ධ කර හෝ නොකර සිදුකරන ගණුදෙනු) සිදු කළ හැක.<br>• **ගිණුම් ප්‍රකාශ දින-** සෑම මසකම 15 සහ අවසාන දිනය<br>• **බිල් ගෙවීමේ විකල්ප** - CDB ශාඛා, Self App, චෙක්පත් සහ Cargills අලෙවිසැල්<br>• **අතිරේක කාඩ්පත්** - පවුලේ ඕනෑම සමීප සාමාජිකයෙකුට කාඩ්පතක් ලබා ගෙන ඔබේ සීමාව භාවිතා කළ හැකි අතර එය ඔබගේ කාඩ්පත් ගිණුමට එකතු කරනු ලැබේ.<br>• ණය කාඩ්පත් වල වලංගු කාලය අවුරුදු 4කි.<br>• CDB Self App මගින් ඔබගේ ණය කාඩ්පතේ පවතින ශේෂය තත්කාලීනව බලා ගත හැකි අතර, ණය කාඩ් අංකය ආරක්ෂිතව ජනනය කිරීම සහ කළමනාකරණය කිරීමද සිදු කළ හැක. |
| **ප්‍රතිලාභ සහ අමතර සේවාවන්** | • ජීවිත කාලය පුරා වාර්ෂික ගාස්තුවක් නොමැත.<br>• CDB Self App – Green PIN අංකය ජනනය කිරීම, පවතින ශේෂය තත්කාලීනව (Real Time) බලා ගැනීම.<br>• World කාඩ්පත් හිමියන් සඳහා සංචාරක රක්ෂණයක් හිමි වේ.<br>• MasterCard Lounge Key නොමිලේ ගුවන් තොටුපළ විවේකාගාර පහසුකම් ලබා ගැනීමට World කාඩ්පත් හිමියන් සඳහා කැලැන්ඩර් වර්ෂයකට ප්‍රවේශයන් දෙකක් හිමි වේ.<br>• සමානුපාතික මාසික වාරික සැලැස්ම (EMI සැලැස්ම) - රු.10,000/- ට වැඩි ඕනෑම මිලදී ගැනීමක් අඩු පොලී අනුපාතයකට, වාරික සැලැස්මක් බවට පරිවර්තනය කිරීමේ හැකියාව.<br>• ක්‍රෙඩිට් කාඩ්පත් හරහා මුදල් අත්තිකාරම් (ATM යන්ත්‍ර හරහා ක්ෂණික මුදල් ආපසු ගැනීම්)<br>• ක්‍රෙඩිට් කාඩ්පතෙහි සීමාව වැඩි කිරීම් සහ ක්‍රෙඩිට් කාඩ්පත අධිශ්‍රේණිගත කිරීම.<br>• විවේකය, භෝජන, ජීවන රටාව සඳහා නිෂ්පාදිත ආදිය ආවරණය වන විශේෂ වට්ටම් දීමනා. කරුණාකර (https://www.cdb.lk/cdb-offers ) වෙත පිවිසෙන්න.<br>• නොමිලේ ලබාදෙන විද්‍යුත් ගිණුම් ප්‍රකාශන සහ SMS පහසුකම් හරහා කාඩ්පතෙහි සෑම ගනුදෙනුවක්ම නිරීක්ෂණය කිරීමේ හැකියාව. |

| | |
|---|---|
| **පොලී අනුපාතය සහ දඩ මුදල්, ගාස්තු, ගාස්තු සහ කොමිස්** | • වෙළඳපොළ අනුපාතවලට අනුකූලව පොලී අනුපාතය අදාළ වේ.<br>• කාඩ්පත් සම්බන්ධතා ගාස්තු කාඩ්පත් වර්ග අනුව අදාළ වේ. (Standard, Gold, Titanium, Platinum සහ World Card )<br>• ප්‍රමාද ගෙවීම් ගාස්තුව, සීමාව ඉක්මවා යාමේ ගාස්තුව සහ ක්‍රෙඩිට් කාඩ්පත සඳහා අදාළ වන අනෙකුත් සියලුම ගාස්තු CDB ආයතනික වෙබ් අඩවියේ යාවත්කාලීන කර ඇත. https://www.cdb.lk/products/cards/credit-cards |
| **නියමයන් සහ කොන්දේසි** | සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි, ක්‍රෙඩිට් කාඩ්පත් මෙහෙයුම් සඳහා වන චර්යාධර්ම සංග්‍රහය, කාඩ්පත් ගෙවීම්වලට අදාළ ආරවුල්, ක්‍රෙඩිට් කාඩ්පත් ගාස්තු, පොලී ගණනය කිරීම සහ ක්‍රෙඩිට් කාඩ්පත් හිඟ ශේෂය සඳහා ප්‍රමාද ගෙවීම් ගාස්තුව ආයතනික වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. https://www.cdb.lk/products/cards/credit-cards |
| **සේවාව ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය** | • ශ්‍රී ලංකාවේ පදිංචි සහ වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයෙකු / වෘත්තිකයෙකු.<br>• පාරිභෝගික පැතිකඩ මත පදනම්ව ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි පහත දැක්වේ.<br><br>**<u>වැටුප් ලබන ගනුදෙනුකරුවන්</u>**<br><br>• නිසි ලෙස සම්පූර්ණ කරන ලද ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත<br>• ජාතික හැඳුනුම්පතේ පිටපත, වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපත හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත<br>• සේවායෝජකයා විසින් තහවුරු කරන ලද ආසන්නතම මාස 3ක වැටුප් පත්‍රිකා<br>• ස්ථිර ලිපිනය සනාථ කිරීම සඳහා මෑතකදී නිකුත් කරන ලද උපයෝගිතා බිල්පතක පිටපත<br>• පසුගිය මාස 3 ක බැංකු ප්‍රකාශන<br>• ඇපකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත<br><br>**<u>ස්වයං රැකියාලාභී / ව්‍යාපාර</u>**<br><br>• නිසි ලෙස සම්පූර්ණ කරන ලද ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත<br>• ජාතික හැඳුනුම්පතේ පිටපත, වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපත හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත<br>• ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය<br>• සීමිත වගකීම් ඇති සමාගමක් සඳහා වන ආකෘති පත්‍ර 18 සහ 20<br>• පසුගිය මාස හතර සඳහා (සමාගමේ සහ පුද්ගලික) බැංකු ප්‍රකාශන |

| | |
|---|---|
| | • ස්ථිර ලිපිනය සනාථ කිරීම සඳහා මෑතකදී නිකුත් කරන ලද උපයෝගිතා බිල්පතක පිටපත<br>• ඇපකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපත<br><br>**<u>දැනට සිටින ගනුදෙනුකරුවන්</u>**<br><br>• නිසි ලෙස සම්පූර්ණ කරන ලද ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත<br>• පවතින පහසුකම ඇපකරයක් ලෙස සුරක්ෂිත කළ යුතුය.<br><br>**<u>වෙනත් බැංකු කාඩ්පත් (OBC)</u>**<br><br>• නිසි ලෙස සම්පූර්ණ කරන ලද ක්‍රෙඩිට් කාඩ් අයදුම්පත<br>• ජාතික හැඳුනුම්පතේ පිටපත, වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපත හෝ වලංගු රියදුරු බලපත්‍රයේ පිටපත<br>• පසුගිය මාසයේ <u>වෙනත් බැංකු කාඩ්පත්</u> (OBC) ප්‍රකාශය<br>• වලංගු ආදායම් තහවුරු කිරීමේ ලේඛන<br>• ස්ථිර ලිපිනය සනාථ කිරීම සඳහා මෑතකදී නිකුත් කරන ලද උපයෝගිතා බිල්පතක පිටපතක්<br>• ඇපකරුගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්<br><br>**සමානුපාතික මාසික වාරික සැලැස්ම** (EMI සැලැස්ම)<br><br>• කාඩ්පත් හිමියා දින 30ක් ඇතුළත ඉල්ලීම කළ යුතුය.<br><br>**මුදල් අත්තිකාරම්**<br><br>කාඩ්පත් හිමියන්ට ඕනෑම බැංකු ATM යන්ත්‍රයකින් මුදල් ආපසු ගැනීමෙන් ක්‍රෙඩිට් කාඩ්පතෙන් 'මුදල් අත්තිකාරමක්' ලබා ගත හැකිය. මුදල් අත්තිකාරම් සීමාවන් පහත පරිදි වේ.<br><br>• World කාඩ්පත - ණය සීමාවෙන් 10%<br>• Standard, Gold, Titanium, Platinum - ණය සීමාවෙන් 20%<br><br>**ණය කාඩ්පතෙහි සීමාව වැඩි කිරීම් සහ ක්‍රෙඩිට් කාඩ්පත අධිශ්‍රේණිගත කිරීම.** |

| | |
|---|---|
| | කාඩ්පත් හිමියන්ට ණය කාඩ්පත් සීමාව වැඩි කිරීම සඳහා ඉල්ලා සිටිය හැකි අතර CDB ආයතනය විසින් එය සලකා බලා ණය සීමාව වැඩි කර කාඩ්පත් වර්ගය ඒ අනුව යාවත්කාලීන කරනු ඇත. (එවැනි ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී CDB ආයතනය ස්වාධීන ඇගයීම් නිර්ණායකයක් අනුගමනය කරයි) |
| **ගණුදෙනු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සහ විමසීම් සඳහා** | - කරුණාකර අපගේ 24/7 CDB ණය කාඩ්පත් ක්ෂණික ඇමතුම් අංකය අමතන්න.<br>- World/ Platinum - 011 7 121 121<br>- Standard/ Gold/ Titanium - 011 7 121 122<br>- අපගේ විද්‍යුත් තැපෑල වෙත යොමු කරන්න. cards.customercare@cdb.lk<br>- අපගේ ළඟම ඇති ශාඛාවට පිවිසෙන්න. |
| **අදාළ නීතිමය විධිවිධාන** | • 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් රෙගුලාසි<br>• 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධති රෙගුලාසි |

## ප්‍රධාන තොරතුරු ලේඛනය - හර කාඩ්පත්

| නිර්ණායක | විස්තරය |
|---|---|
| **ප්‍රධාන ලක්ෂණ සහ ස්වභාවය** | • VISA හර කාඩ්පතක් ලබා ගත හැකිය.<br>• බාලවයස්කාර ඉතුරුම් ගිණුම් හිමියන් හැර, CDB හි සියලුම ඉතුරුම් ගිණුම් හිමියන්ට CDB හර කාඩ්පත් නිකුත් කරනු ලැබේ.<br>• ක්ෂණික සහ පුද්ගලීකරණය නොකළ කාඩ්පත් නිකුත් කිරීම.<br>• දෙමුහුණත් කාඩ්පත් (ආරක්ෂිත කාවැද්දූ චිපය මගින් සම්බන්ධ කර හෝ නොකර සිදුකරන ගණුදෙනු) නිකුත් කරනු ලැබේ.<br>• ගනුදෙනු පිළිබඳ නොමිලේ සහ ක්ෂණික කෙටි පණිවුඩ (දේශීය සහ ජාත්‍යන්තර ගනුදෙනු)<br>• සම්බන්ධතා රහිත ගෙවීම් සඳහා PayWave තාක්ෂණය සක්‍රීය කර ඇත.<br>• හර කාඩ්පත් වලංගු කාලය අවුරුදු (05) කි. |

| | |
|---|---|
| **ප්‍රතිලාභ සහ අමතර සේවාවන්** | • CDB ආයතනය විසින් නියම කර ඇති දෛනික මුදල් ආපසු ගැනීමේ / මිලදී ගැනීමේ සීමාවන්ට යටත්ව ඉතුරුම් ගිණුමේ ඇති මුදල් ආපසු ගැනීමට / මිලදී ගැනීමට කාඩ්පත් හිමියාට හැකියාව ලබා දී ඇත.<br>• CDB හෝ වාණිජ හෝ වෙනත් බැංකු ATM යන්ත්‍ර හරහා 24/7 මුදල් ආපසු ගැනීම් සිදු කළ හැකිය.<br>• දේශීය සහ ජාත්‍යන්තර ගෙවීම් සඳහා මාර්ගගත ක්‍රමය හරහා ගෙවීම් පහසුකම.<br>• දේශීයව සහ ලොව පුරා පිළිගත් කාඩ්පතක් ලබා ගත හැක. |
| **හර කාඩ්පත් ගාස්තු** | හර කාඩ්පත් නිකුත් කිරීමේ ගාස්තුව, වාර්ෂික ගාස්තුව සහ හර කාඩ්පත සඳහා අදාළ වන අනෙකුත් සියලුම ගාස්තු CDB ආයතනික වෙබ් අඩවියෙන් යාවත්කාලීන කර ඇත. https://www.cdb.lk/products/cards/debit-cards |
| **නියමයන් සහ කොන්දේසි** | සාමාන්‍ය නියමයන් සහ කොන්දේසි සහ හර කාඩ්පත් ගාස්තු, ආයතනික වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. https://www.cdb.lk/products/cards/debit-cards |
| **සේවාව ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය** | CDB ආයතනයේ ඉතුරුම් ගිණුමක් පවත්වාගෙන යන වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම ශ්‍රී ලාංකික පදිංචිකරුවෙකු හට හර කාඩ්පතක් අයදුම් කළ හැක. |
| **ගණුදෙනු සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් සහ විමසීම් සඳහා** | - කරුණාකර අපගේ 24/7 CDB ණය කාඩ්පත් ක්ෂණික ඇමතුම් අංකය 011 7 388 399 අමතන්න.<br>- අපගේ විද්‍යුත් තැපෑල වෙත යොමු කරන්න. cards.customercare@cdb.lk<br>- අපගේ ළඟම ඇති ශාඛාවට පිවිසෙන්න. |